# ගවයින් වර්ගීකරණය



- සම්භවය අනුව වර්ගීකරණය
- ප්‍රයෝජන අනුව වර්ගීකරණය

J.L.I.S. ඒකනායක
මහා/සීතාදේවි බාලිකා විද්‍යාල

# ප්‍රයෝජන අනුව වර්ගීකරණය

1. කිරි ලබා ගැනීම සඳහා

   ජර්සි, අයර්ෂයර්,සින්දී ,සහිවාල්

2. මස් ලබා ගැනීම සඳහා

   හෙරිෆාඩ්, බීෆ් මාස්ටර්,

3. ශ්‍රමය/බර වැඩ සඳහා

   කිලරි,තර්පාකර්, කන්ගයම්

# සම්භවය අනුව වර්ගීකරණය

| ඉන්දීය ගව වරිග | යුරෝපිය ගව වරිග |
|---|---|
|  |  |
| • ඉන්දීය සම්භවයකි. | • යුරෝපිය සම්භවයකි. |
| • ශරීරය සාපේක්ෂව කුඩාය.<br>• මොල්ලිය, තැල්ල,පෙකණි පෙත්ත මනාව වර්ධනය වී ඇත.<br>• ශරීරයේ පිටුපස රවුම්ය. | • ශරීරය සාපේක්ෂව විශාලයි.<br>• මොල්ලිය, තැල්ල,පෙකණි පෙත්ත මනාව වර්ධනය වී නැත.<br>• ශරීරයේ පිටුපස රවුම් නැත. |
| • වැඩි උෂ්ණත්වයට ඔරොත්තු දේ.<br>• කෙටි ලෝම සහිත,ශ්වේද ග්‍රන්ථි වැඩි, ඇදෙන සුළු සමකි. | • වැඩි උෂ්ණත්වයට ඔරොත්තු නොදේ<br>• දිගු ලෝම සහිත, ශ්වේද ග්‍රන්ථි අඩු,සම ශරීරයට තද වූ සමකි. |
| • කිරි නිෂ්පාදනය අඩුය . | • කිරි නිෂ්පාදනය වැඩිය. |

# යුරෝපීය ගව වර්ග



- ෆ්‍රීෂියන්
- අයර්ෂයර්
- ජර්සි

| ෆ්‍රීසියන් | අයර්ෂයර් | ජර්සි |
|---|---|---|
|  |  |  |
| • නෙදර්ලන්තය සම්භවයකි. | • බ්‍රිතාන්‍ය සම්භවයකි. | • යුරෝපයේ ජර්සි දූපත |
| • ශරීරය සුදු පුල්ලි සහිතය.<br>• අං දිගය . | • රතු හෝ දුඹුරු පුල්ලි සහිත සුදු ශරීරයකි<br>• අං දිගය | • දුඹුරු හෝ තඹ හෝ අළු<br>• අං උල් වී ඉදිරියට නැවී |
| • ශරීරය විශාලය<br>පිරිමි සතුන් **900-1100 kg**<br>ගැහැණු සතුන් **550 - 650 kg** | • ශරීරය මධ්‍යමය.<br>පිරිමි සතුන් **800 – 900 kg**<br>ගැහැණු සතුන් **600 – 700 kg** | • ශරීරය කුඩාය<br>පිරිමි සතුන් **500 -600 kg**<br>ගැහැණු සතුන් **400 – 500 kg** |
| • කිරි නිෂ්පාදනය වැඩිම<br>එක් මුරයකදී **6000 –7000l**<br>කිරි මේද **- 3.5 – 4.0 %** | • කිරි නිෂ්පාදනය<br>එක් මුරයකදී **4500 -6000 l**<br>කිරි මේද **4 %** | • කිරි නිෂ්පාදනය<br>එක් මුරයකදී **4000 -4500 l**<br>කිරි මේද **4.5 -5.5 %** |
| • ශ්‍රී ලංකාවේ උඩරට තෙත් කලාපයට සුදුසුය.<br>• ශීතදේශගුණයට සුදුසුය. | • ශ්‍රී ලංකාවේ උඩරට තෙත් කලාපයට සුදුසුය. | • උඩරට හා මැදරට තෙත් කලාපවලට සුදුසුය.<br>• කටුක පරිසරයට සුදුසුය. |

# ෆ්‍රීසියන්



# අයර්ෂයර්



# ජර්සි



# ඉන්දීය ගව වර්ග



සහිවල්

රතු සින්දි

| සහිවල්  | රතු සින්දී  |
| --- | --- |
| • පකිස්තාන් සම්භවයකි. | • පකිස්ථානයේ කරච්චි සම්භවයකි |
| • කිරි ලබා ගැනීමට සුදුසුය. | • කිරි සහ ශ්‍රමය (ද්විකාර්ය) සුදුසුය. |
| • රතු දුඹුරු සමකි.<br>• මොල්ලියක් සහ එල්ල වැටන තැල්ලක් ඇත. | • රතු හෝ දුඹුරු පැහැතිය.<br>• මොල්ලිය විශාලය, පාශ්විකව දිගු වක්වූ අං සහ විශාල කන් සහිතය. |
| • විශාල ශරීරයකි<br>පිරිමි සතුන් 500 - 600 kg<br>ගැහැණු සතුන් 400 – 450 kg | • ශරීරය මධ්‍යම ප්‍රමාණයකි.<br>පිරිමි සතුන් 450 – 500 kg<br>ගැහැණු සතුන් 300 – 350 kg |
| • කිරි නිෂ්පාදනය<br>එක් මුරයකදී 2000 – 2500 l<br>කිරි මේද 4.5% | • කිරි නිෂ්පාදනය<br>එක් මුරයකදී 2000 l<br>කිරි මේද 4.5 -5 % |
| • ශ්‍රී ලංකාවේ වියළි කලාප, මැදරට හා පහතරට වියළි කලාප වලට සුදුසුය. | ශ්‍රී ලංකාවේ වියළි කලාපයට සුදුසුය. |

# දේශීය එළ ගව වරිගය /බටු හරක්




- මෙරට උපත ලද කුඩා ගව වරිගකි.
- ශරීරය රතු හෝ කළු වර්ණයකි,සුදු පුල්ලි සහිතය.
- පිරිමි සතෙකු 200-300 kg, ගැහැණු සතෙකු15-300 kg
- කිරි හා මස් ලබා ගැනීමට සහ බර ඇදීමට ,සී සැමට යොදාගනී.
- කටුක පරිසර වලට ඔරොත්තුදෙන, අඩු පහසුකම් යටතේ ජීවත් විය හැක.
- වියළි කලාපයේ බහුලව ජීවත් වෙයි.

# මී ගව වර්ග

දේශීය මී ගවයා
විදේශීය මී ගව වර්ග
- මූරා
- සූරති
- නිලිරවී

# දේශීය මි ගව වර්ග

## දේශීය මි ගවයා / වගුරු මි ගවයා






- ශරීරය කළු හෝ දුඹුරු හෝ අළු පැහැ වෙයි.
- තියුණු, වැඩුණු අං පිහිටයි.
- අඩු කිරි නිෂ්පාදනයකි.
- කෘෂිකාර්මික කටයුතු (ශ්‍රමය) යොදා ගනී.

# විදේශීය මී ගව වරිග

| මූරා | සුරති | නිලිරාවී |
| --- | --- | --- |
|  |  |  |
| • පන්ජාබ් හා දිල්ලි ප්‍රදේශයේ සම්භාවකි. | • පන්ජාබ් සුර්ති ප්‍රදෙශයේ සම්භාවකි. | • ඉන්දියන් සහ පකිස්තාන් සම්භාවකි. |
| • තද කළු වර්ණයකි.<br>• අන් කෙටිය ,රැලි ගැසී පහතට උඩට හා ඉදිරයට නම් ඇත. | • දුඹුරු පැහැතිඅළු වර්ණයකි<br>• අන් දකති හැඩය | • කළු හෝ දුඹුරු වර්ණයකි. නළල ,පාදය හා වලිගය කෙලවර සුදුය.<br>• ඇස් දීප්තිමත්ය, අන් දගර ගැසී ,වලිගය දිගය බිම ගැවෙයි. |
| • ශරීර ප්‍රමාණය<br>පිරිමි සතුන් 600 – 700 Kg<br>ගැහැණු සතුන් 500 – 600 Kg | • ශරීර ප්‍රමාණය<br>පිරිමි සතුන් 550 -600 kg<br>ගැහැණු සතුන් 400 -500 kg | • ශරීර ප්‍රමාණය<br>පිරිමි සතුන් 600 -7 00 kg<br>ගැහැණු සතුන් 450 -55 0 kg |
| • කිරි නිෂ්පාදනය<br>• එක මුරයකට1200 –2000l<br>• කිරි මේදය 7% කි. | • කිරි නිෂ්පාදනය<br>• එක මුරයකට1300 - 1400l<br>• කිරි මේදය 7 – 7.5 % | කිරි නිෂ්පාදනය<br>එක මුරයකට 200 l<br>කිරි මේදය 7 – 7.5 % |

# මුරා



# සුර්ති



# නිලරාවී



# කුකුළන් වර්ගීකරණය



- ඇති කරනු ලබන පරමාර්ථය අනුව කුකුළන් වර්ගීකරණය
- සම්බවය අනුව කුකුළන් වර්ගීකරණය

# ඇති කරනු ලබන පරමාර්ථය අනුව කුකුළන් වර්ගීකරණය

1. **බිත්තර ලබා ගැනීම.**

   ලේගෝන්,හයිසෙක්ස් (සුදු), හයිසෙක්ස් (දුඹුරු), හයි ලයින් (සුදු)

2. **මස් (බොයිලර්) ලබා ගැනීම**

   ලොමාන්,හබර්ඩ ,ෂෙවර්, ස්ටාබ්‍රෝ,හයිබ්‍රෝ

3. **ද්විකර්යය (බිත්තර සහ මස් )සදහා**

   ආර්.ඇයි.ආර්, ඔස්ට්‍රලෝප්

# සම්භවය අනුව කුකුළන්වර්ගීකරණය

| බ්‍රිතාන්‍ය වරිග | මධ්‍යධරණී වරිග | ඇමරිකානු වරිග | ආසියාතික වරිග |
|---|---|---|---|
| • මස් සහ දෙමුහුම් වාණිජ කුකුළු නිෂ්පාදනය සඳහා යොදා ගනියි. | • බිත්තර නිෂ්පාදනය යොදා ගනියි. | • ද්විකාර්යය යොදා ගනියි. (බිත්තර සහ මස් සඳහා) | • මස් නිෂ්පාදනයට යොදා ගනියි. |
| | | • කෙන්ඩවල පිහාටු නොමැත ,කෙන්ඩ හා සම කහ පැහැතිය , | • කෙන්ඩ පිහාටු සහිතයි |
| | | • කන් පෙති රතු පැහැතිය. | • කන් පෙති රතු පැහැතියි. |
| | • කටුව සුදු පැහැතිය. | • බිත්තර දුඹුරු පැහැතිය. | බිත්තර දුඹුරු පැහැතිය. |
| ඕර්පින්ටන් ,සසෙක්ස්,ඔස්ට්‍රලෝප්, කොනිෂ් | • ලේගෝන්, මිනෝකා, ඇනකොනා | • නිව් හැම්ප්ෂයර්, ආර්.ඇයි.ආර්, ප්ලිමත්රෝක් | බ්‍රග්මා, කොචින්,ලාංග්ෂන් |

# බ්‍රිතාන්‍ය වරිග

| | |
|---|---|
| **සසෙක්ස්**  | **ඔස්ට්‍රලෝප්**  |
| • පිහාටු ලා රතු හා රතු මිශ්‍ර කළු පැහැතිය<br>• වලිග පිහාටු කළු පැහැතිය.<br>• කෙන්ඩ හා නියපොතු වර්ණවත්ය. | • පිහාටු කළු පැහැතිය<br>• ශරීරයට බැදී පිහිටයි.<br>• කොන්ද ඉදිරියේ සිට පිටුපසට අනත පිහිටයි. |
| • තනි කරමල් සහිත හොටකි. | • තනි කරමලයකි. |
| • පිරිමි සතෙකු 4kg<br>• ගැහැණු සතෙකු 3 kg | • පිරිමි සතෙකු 3.9 -4.7 kg<br>• ගැහැණු සතෙකු 3.3 – 4.2 kg |
| | • ද්කාර්යය වර්ගයකි, බිත්තර කටුව දුඹුරු පැහැතියි. |

# මධ්‍යධරණී වර්ග

## ලේගෝන්



- ඉතාලි සම්භාවකි.
- සැහැල්ලු ශරීරයකි. (පිරිමි 3.4 , ගැහැණු 2.5 kg )
- පිහාටු වර්ණය අනුව වර්ග 12 කි.

උදා - වයිට් ලේගෝන්, බ්‍රයුන් ලේගොන්

# ඇමරිකානු වරිග

| | |
|---|---|
| **ආර්.ඇයි.ආර්**  | **නිව් හැම්ප්ෂයර්**  |
| • පිහාටු රතු දුඹුරු පැහැතිය.<br>• තනි කරමල් රෝස පැහැතිය.<br>• දිග චතුරශ්‍රාකර,පුළුල් හා ගැඹුරු දේහයකි | • දිලිසෙන රතු දුඹුරු පිහාටු ,වලිග පිහාටු කළු පැහැතිය. |
| • පිරිමි සතෙකු 4 kg හා ගැහැණු සතෙකු 3 kg වෙයි. | පිරිමි සතෙකු 3. 8kg හා ගැහැණු සතෙකු 2.7  kg වෙයි. |

# ආසියාතික වර්ග

| බ්‍රග්මා | කොචින් |
|---|---|
| • ඉන්දීය සම්භවයකි. | චීන සම්භවයකි. |
| • පිහාටු ල පැහැතිය<br>• පී කරමල දරයි. | • ලිහිසි පිහාටු සහිතය,<br>• පැහැය අනුව මාදිලි කිහිපයකි.<br>• තනි කරමල් |
| • පිරිමි සතෙකු 4.5  kg හා ගැහැණු සතෙකු 3.8  kg වෙයි. | • පිරිමි සතෙකු 4.4kg හා ගැහැණු සතෙකු 3. kg වෙයි. |